# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,970 - 2016 ජුනි මස 03 වැනි සිකුරාදා - 2016.06.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 942 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 948 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |


**සැ. යු. -** විශ්ව විද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත 2016 අප්‍රේල් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීන් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජුනි මස 24 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජුනි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## යටවත්ත ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ යටවත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් සපුරා ඇති යටවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | මාර්ග කම්කරු | 01 | රා.ප.ච.03/2016 උපලේඛන I අනුව PLI - 2016 - 24250 -10 X250-10X270-10X300-12X 330-36410 එනමුත් ගෙවීම් සිදු කරන්නේ උපලේඛන II අනුවය. ආරම්භක වැටුප - 14,234/- | (i) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක්වරක දී සමත්ව තිබිය යුතුය.<br>(ii) ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පමණක් 5 වන ශ්‍රේණිය සමත්වීම සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. |

02. *බඳවා ගැනීම් කොන්දේසි :-*

(i) අයදුම්කරු යටවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතුය.
(v) අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත ස්ථිර තනතුරු දරන අය සඳහා උපරිම වයස් සීමාවන් බල නොපැවැත්වේ. යටවත්ත ප්‍රාදේශීය සභාවේ සේවය කළ හෝ දැනටමත් සේවයේ නියුතු අය සඳහා ප්‍රමුඛතාවය හිමිවේ.)

03. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය
(ii) වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දයකත්වය හිමිවේ.
(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගයන්ට ද මධ්‍යම පළාතේ පළාත් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නියෝග කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට ද අනුකූලව ක්‍රියාකිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ. අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;
(iv) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ලබාගත යුතුය)
(v) වෘත්තිය හෝ පළපුරුද්ද පිළිබඳ සහතිකය.
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ නියුක්ත වුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.)

05. මූලික සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

06. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එහි ප්‍රතිඵල අනුව බඳවා ගැනීම් කරනු ලැබේ.

07. *අයදුම් කළ යුතු ආකාරය :-*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2016.06.20 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "**ලේකම්, ප්‍රාදේශීය සභාව, යටවත්ත**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

2. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**මාර්ග කම්කරු තනතුර සඳහා බඳවා ගැනීම**" ලෙස සඳහන් කර එවිය යුතුය.

3. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය යටවත්ත ප්‍රදේශීය සභාවේ ලේකම් සතුවේ.

ඩී. එම්. ලලිතා සෝමාවතී,
ලේකම්,
යටවත්ත ප්‍රාදේශීය සභාව.

2016 මැයි මස 11 වැනි දින,
යටවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම් පත්‍රය

**යටවත්ත ප්‍රාදේශීය සභාවේ මාර්ග කම්කරු තනතුර සඳහා අයදුම්පත**

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————.
02. මුලකුරු සමඟ නම :——————.
03. ස්ථිර ලිපිනය :——————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.
05. උපන් දිනය :——————.
වර්ෂය :——————.මාසය:——————.දිනය:——————.
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :——————.
අවුරුදු :——————.මාස:——————.දින:——————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.
08. විවාහක/අවිවාහක බව :————.
09. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග :————.
11. අධ්‍යාපන සුදුසුකම් (සහතික වල ඡායා පිටපත් අමුණා එවන්න):————.
අ.පො.ස. (සා.පෙ.) විභාගය:————.
සමත් වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

අ.පො.ස. (උ.පෙ.) විභාගය ඃ-
සමත් වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

12. (i) වෙනත් අධ්‍යාපන සුදුසුකම්:————.
(ii) වෘත්තීය සුදුසුකම් :————.
(iii) සේවා පළපුරුද්ද :————.

1. දැනට සේවය කරන ආයතනය :————.
2. දැනට දරන තනතුර :————.
3. එම තනතුරට පත් වූ දිනය:————.
4. මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :————.

13. ඔබ දැනටමත් මෙම සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :————.
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් ආදේශක යන වග :————.
එම තනතුරට පත් වූ දිනය :————.
14. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?:————.

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

..................................................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ ........................................................... වශයෙන් සේවයෙන් නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිදේශ කර ඉදිරිපත් කරමි.

___________

ආයතනයේ ප්‍රධානියාගේ අත්සන.

06-15

---

## මිනුවන්ගොඩ නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**උපලේඛනය**

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක III | 01 | PL I/2016 | රු.24250 - 250x10 - 270x10 - 300x10 - 330x12 -රු.36,410 නමුත් රා.ප.චා.ලේ.03/2016 අනුව මූලික වැටුප රු.14,234 ක් හා ඊට අදාළ ගැලපුම් දීමනාව ගෙවනු ඇත.<br>(හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉම) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරි -සෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබී ම. (මින් විෂයයන් පහ (05) එකවර සමත් විය යුතු ය.) |
| 02 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු (කා.සේ.සේ. III) | 02 | PL I/2016 | රු24250 - 250x10 - 270x10 - 300x10 - 330x12 - රු36,410<br>නමුත් රා.ප.චා.ලේ.03/2016 අනු -ව මූලික වැටුප රු.14,234 ක් හා ඊට අදාළ ගැලපුම් දීමනාව ගෙවනු ඇත.<br>( හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉම) | 8 වන ශ්‍රේණිය/ 9 වසර සමත් වී තිබීම |
| 03 | සෞඛ්‍ය කම්කරු කම්කරු (කා.සේ.සේ. III) | 01 | PL I/2016 | රු.24,250 - 250x10 - 270x10 - 300x10 - 330x12 -රු.36,410<br>නමුත් රා.ප.චා.ලේ.03/2016 අනු -ව මූලික වැටුප රු.14234 ක් හා ඊට අදාළ ගැලපුම් දීමනා -ව ගෙවනු ඇත.<br>(හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉම) | 8 වන ශ්‍රේණිය/ 9 වසර සමත් වී තිබීම |

*2. පොදු සුදුසුකම් :*

1. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
2. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් කැඳවන දිනට පෙරාතුව බස්නාහිර පළාතේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචියක් තිබිය යුතුය.
4. අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.
5. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වුවන් සඳහා උපරිම වයස බලපානු නොලැබේ.
6. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබුවෙකු නොවිය යුතුය.

*3. බඳවා ගැනීම හා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
2. නියම කරනු ලබන ප්‍රතිශතයකින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
3. බඳවා ගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
4. සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වාචික පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගැනීම කරනු ලැබේ.

*4. සේවා කොන්දේසි :*

පත්වීම ලබන්නන් ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලට ද, බස්නාහිර පළාත් රෙගුලාසි හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ මීනුවන්ගොඩ නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*5. අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් සකස් කර එවනු ලබන අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව 2016/06/24 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "සභාවේ ලේකම් හා බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී, නගර සභාව, මීනුවන්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තව ද අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධ සලකා බලනු නොලැබේ.

අයදුම්පත්‍රය සමග සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ පහත සඳහන් සහතික පිටපත් අමුණා එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතිකය
3. ග්‍රාම නිළධාරී සහතිකය
4. පළපුරුද්ද පිළිබඳ සහතිකය
5. චරිත සහතික දෙකක්

මෙම අයදුම්පත්‍ර කැඳවීමේදී හෝ කැඳවන අතර තුර හෝ බඳවා ගැනීම හෝ බඳවා නොගැනීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සියළු බලතල මීනුවන්ගොඩ නගර සභාවේ ලේකම් හා බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී සතුවේ.

එච්.ඒ.එස්. රත්නලතා,
ලේකම් හා බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
නගර සභාව,
මීනුවන්ගොඩ.

2016 මැයි මස 19 වැනි දින
මීනුවන්ගොඩ
නගර සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මීනුවන්ගොඩ නගර සභාවේ ............................................................ තනතුරු සඳහා ආදර්ශ අයදුම්පත්‍රය

1. I. මුලකුරු සමඟ නම :——————.
   II. මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————.

2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.

3. ස්ථිර ලිපිනය :——————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

5. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

6. උපන් දිනය : අවුරුද්ද :——————.මාසය :——————.දිනය:——————.

7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :——————.

8. විවාහක/අවිවාහක බව :——————.

9. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද?ලියාපදිංචි වීමෙන් ද ? :——————.

10. අධ්‍යාපන සුදුසුකම් (සහතික වල පිටපත් ඇමිණිය යුතුය) :——————.
(i) ——————.
(ii) ——————.
(iii) ——————.
(iv) ——————.
(v) ——————.
(vi) ——————.

11. I. වෙනත් සුදුසුකම් :——————.
II. වෘත්තීය සුදුසුකම් :——————.
III. සේවා පළපුරුද්ද :——————.

12. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :——————.

I. ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් /ආදේශක ද යන වග :——————.
II. එම තනතුරට පත් වූ දිනය :——————.

13. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? ............................................

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

දිනය :——————.

——————.
අයදුම්කරුගේ අත්සන.

06-180

# පළාත් පාලන නිවේදන

## ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව.

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව විසින් 2016.04.29 වැනි දින පවත්වන ලද මුදල් ප්‍රතිපත්ති කාරක සභා රැස්වීමේ දී තීරණ අංක 04 මගින් පහත උපලේඛනයේ සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. රෝහිණී ජයලත්,
ලේකම්,
ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව.

2016 මැයි මස 10 වැනි දින,
ලුණුගම්වෙහෙර ප්‍රදේශීය සභා කාර්යාලයේ දී ය,

උපලේඛනය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 02 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ දකුණු පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර,ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1834 හා 2013.10.25 දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූ දකුණ පළාතේ පළත් සභාව විසින් 2014.08.12 දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේදී ස්ථිර කරන ලදුව 2014.10.17 දිනැති අංක 1884/61 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවක් වූ දකුණු පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව සහ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව විසින් *ගැසට් පත්‍රයේ* පල කරනු ලබන දින සිට පිළිගෙන ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට ඉහත කී 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නීය.

06-143

---

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

### 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරුව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (i) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව 2016.05.02 දින තීරණ අංක 3586 දරන තීරණය යටතේ ඝණ අපද්‍රව්‍ය කලමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව වැළඳගැනීමට තීරණය කරන ලද බව මෙමගින් නිවේදනය කරමි.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (02) වගන්තියේ (i) උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015.09.25 දින දරන අංක 1933/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික

සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ පලකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ප්‍රදේශීය සභා වල ඝණ අපද්‍රව්‍ය කලමනාකරණය, නිවාස පරිශ්‍රයන්, සාප්පු සහ කාර්යාල, හෝටල්, එළවළු සහ පළතුරු වෙළඳසැල්, මස්, මාළු හෝ බිත්තර වෙළඳකුටි, පදික වෙළඳාම හෝ සංචාරක වෙළඳාම , කර්මාන්තශාලා, කැනීම්, ඉදිකිරීම් හා කඩා දැමීම්, ආරෝග්‍යශාලා, පෞද්ගලික රෝහල හා රසායනාගාර , වෙනත් පරිශ්‍රයන් විථි හා පොදු ස්ථාන, ප්‍රදේශීය සභාවේ යුතුකම්, අවසර පත්‍ර, අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශවල ඝණ අපද්‍රව්‍ය කලමණාකරනය හා දණ්ඩනය ලබා දීම පිළිබඳ යෝජනා සහිත සම්මත අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට ඉහත පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (i) වැනි උපවගන්තිය යටතේ පිළිගැනීමට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

කේ.කේ.යූ.ජේ.එන්. පෙරේරා,
ලේකම්,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.

2016 මැයි මස 03 වැනි දින,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

06-05

---

## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2015 දෙසැම්බර් මස 10 වැනි දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීමේ නිර්දේශ යටතේ පහත උපලේඛනයේ සඳහන් යෝජනාව අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණ අංක 139 යටතේ පිළිගෙන සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. පී. වයලට් මෙනවිය,
ලේකම්,
අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් මස 10 වැනි දින,
අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු, 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013.05.17 දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූද, සම්මත අතුරු ව්‍යවස්ථා වල XXVII වැනි කොටස ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හැර, I වැනි කොටසේ සිට XXIX වැනි කොටස දක්වා වූ අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නීය.

| | | |
|---|---|---|
| I වැනි කොටස | - | සියලු සම්මත අතුරු ව්‍යවස්ථා වලට අදාල අර්ථ නිරූපනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| II වැනි කොටස | - | සියලු සම්මත අතුරු ව්‍යවස්ථා වලට අදාල පොදු විධි විධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| III වැනි කොටස | - | කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධි විධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| IV වැනි කොටස | - | මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |

| | | |
|---|---|---|
| V වැනි කොටස | - | මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| VI වැනි කොටස | - | සිසිල්බීම කර්මාන්තශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| VII වැනි කොටස | - | කොණ්ඩා සැකසීමේ ස්ථාන,බාබර් සාප්පු හා සැලූන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| VIII වැනි කොටස | - | බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| IX වැනි කොටස | - | කිරි පට්ටි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| X වැනි කොටස | - | පිහිනුම් තටාක පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XI වැනි කොටස | - | අයිස් කර්මාන්තශාලා පිළබඳ අතුරු ව්‍යවස්ථාව |
| XII වැනි කොටස | - | බත් කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XIII වැනි කොටස | - | හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XIV වැනි කොටස | - | නවාතැන් පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XV වැනි කොටස | - | ලොන්ඩරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XVI වැනි කොටස | - | කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XVII වැනි කොටස | - | අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XVIII වැනි කොටස | - | සංචාරක වෙළඳුන් විසින් ආහාරපාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XIX වැනි කොටස | - | පදික මාරු ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XX වැනි කොටස | - | ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන විධිමත් කිරීම,අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XXI වැනි කොටස | - | වාහන නතර කිරීම හා හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XXII වැනි කොටස | - | මාර්ග වලට අලාභහානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධාකිරීම වැලැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XXIII වැනි කොටස | - | අදාහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XXIV වැනි කොටස | - | පොදු වෙළඳපොළ පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XXV වැනි කොටස | - | ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XXVI වැනි කොටස | - | ප්‍රජාශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XXVIII වැනි කොටස | - | උකස් හා උකස් හිමියන් ලියාපදිංචි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XXIX වැනි කොටස | - | වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |

06-179

---

## මාතර ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (i) උප වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1834 හා 2013.10.25 දිනැති *ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ නිවේදනය කරනු ලැබූ දකුණු පළාතේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශ තුළ,ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා සහ මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා දකුණු පළාත් සභාව විසින් 2014.08.12 දින මහා සභාවේදී ස්ථිරකර 2014.10.17 දින අංක 1884/61 IV (අ) පළාත් සභා *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති අතර 2015.05.12 දින මාතර ප්‍රාදේශීය සභා තීරණ පොතේ තීරණ අංක 722 යටතේ වැළඳගෙන *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී.ජී. පියල් රණදේව,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2016 මැයි මස 17 වැනි දින,
06-58/1

## මාතර ප්‍රාදේශීය සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (i) උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.05.17 දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද්ද වූ ද දකුණු පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්ද වූ සම්මත අතුරු ව්‍යවස්ථාවල ඃ

(i) සියළු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාල අර්ථ නිරූපනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(ii) සියළු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාල පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(iii) කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(xviii) අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(xix) සංචාරක වෙළඳුන් විසින් ආහාරපාන ද්‍රව්‍ය වෙළඳම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(xxii) වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(xxii) මාර්ග වලට අලාභහානි කිරීම හා මාර්ගවල ගමනා ගමනයට බාධා කිරීම වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(xxvi) ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(xxvii) ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

මේ පිළිබඳ තීරණය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (i) වන උප වගන්තිය යටතේ මාතර ප්‍රාදේශීය සභාව මෙයින් තීරණය කරයි.

261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (i) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර 2016.05.12 දින මාතර ප්‍රාදේශීය සභා තීරණ පොතේ තීරණ අංක 723 යටතේ වැළඳගෙන ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී.ජී. පියල් රණදේව,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2016 මැයි මස 17 වැනි දින,
06-58/2

---

## මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

### ඝන අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලදුව අංක 1834 හා 2013.10.25 දිනැති *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දවූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද 2014.10.17 දිනැති 1884/61 *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්ද වූ, ඝන අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ *ගැසට් පත්‍රයේ* පලවන දින සිට පනවා ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව විශේෂ තීරණ අංක 1283 - 111 හා 2016.04.08 යටතේ තීරණය කර ඇති බව මෙයින් මහජනතාවට දැනුම්දෙනු ලැබේ.

ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේද,
ලේකම්,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව .

2016 මැයි මස 05 වැනි දින,
මාලිම්බඩ සභා කාර්යාලයේ දී ය.
06-04

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති *උපලේඛනයේ* දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2016** | | | |
| **ජූනි** | 2016.06.03 | සිකුරාදා | 2016.05.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.10 | සිකුරාදා | 2016.05.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.17 | සිකුරාදා | 2016.06.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.24 | සිකුරාදා | 2016.06.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2016.07.01 | සිකුරාදා | 2016.06.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.08 | සිකුරාදා | 2016.06.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.15 | සිකුරාදා | 2016.07.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.22 | සිකුරාදා | 2016.07.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.07.29 | සිකුරාදා | 2016.07.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2016.08.05 | සිකුරාදා | 2016.07.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.12 | සිකුරාදා | 2016.07.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.19 | සිකුරාදා | 2016.08.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.26 | සිකුරාදා | 2016.08.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.